**පවතින අර්බුධයෙන් රට ගොඩ ගැනීම සඳහා නිර්පාක්ෂික ජන අරගලකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන තිරසර සංවර්ධනය කේන්ද්‍ර කොටගත් ගාලු මුවදොර යෝජනාවලිය.**

**(කෙටි කාලීන වැඩපිළිවෙල)**

ගාලුපාරේ ජන අරගලකරුවනුත් යම් ප්‍රගතිශීලී පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ හඬත් වෙන් වෙන් ව වුව ද ගත් ක්‍රියාමාර්ග තුළින් රාජපක්ෂ පවුලේ දේශපාලනය මේ වන විට යටපත් වී ඇත. එහෙත් අපේ අරගලයට නිශ්චිත දේශපාලන නායකත්වයක් හෝ ජාතිකත්වයක් නොමැති වීමත් අර්බුදය තේරුම් ගැනීම හා ඊට විසඳුම් සෙවීමට දැක්මක් හා වැඩපිළිවෙළක් නොමැති වීමත් නිසා විශාල මහජන පිබිදීමක් දැන් ක්‍රමයෙන් දිය වෙමින් පවතී. මැයි 09 වෙනිදා සිද්ධිය නොවන්නට මෙම අරගලය මීටත් වඩා දිය වන්නට ඉඩ තිබුණි. මෙම යථාර්ථය තේරුම් ගනිමින් දැක්මක් සහිත වැඩපිළිවෙළක් මුල්කරගෙන යළිත් මෙම ජන අරගලය අපි සැවොම එය යළි එක්ව පිබුදුවා ගත යුතුය.

යම් යම් විසිරී ගිය ජන කණ්ඩායම් හා දේශපාලන කණ්ඩායම් අප එකතු කළ යුත්තේ දැක්මක් මතයි. නිර්පාක්ෂික ජන අරගලය යැයි කියමින් එක්තරා කණ්ඩායමක් පමණක් දේශපාලනය කරමින් ඒ කරන්නා වූ දේශපාලනය කුමක්දැයි ජනතාවට පැහැදිලි නැති තත්ත්වයක් තුළ යළිත් සාම්ප්‍රදායික දේශපාලන  බලවේගය ම ශක්තිමත් වනු ඇත. ඒ අනුව ඉතා විවෘතව අපි අපගේ දැක්ම හා වැඩපිළිවෙළ ඉදිරිපත් කරන අතර එම දැක්මට එකඟ පුළුල් දේශපාලන සංවාදයක් සියලු දේශපාලන පක්ෂ සමග ආරම්භ කිරීමට අපි පෙරමුණ ගන්නෙමු. අද පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවලට ඇති අර්බුදය නම් දැක්මක් හා වැඩපිළිවෙළක් නොමැති වීමයි. අද අතිමහත් අර්බුදයක ගිලී සිටින රට එම අගාධයෙන් ගොඩ ගැනීම උදෙසා අපගේ දැක්ම අපි මෙලෙස ඉදිරිපත් කර සිටිමු.

තරගකාරී වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට මුළු ලෝකයම හසුවූ ලෝකයම හසුවූ යුගයක් ලෙස පසුගිය වසර පනහක කාලය හැඳින්විය හැකිය. නිදහස් වෙළඳාම තුළ බලවත් වූ රටවල් කිහිපයක සමාගම් කිහිපයක් ලෝකය හැසිරවීම ගෝලීය වශයෙන් බරපතළ අර්බුදයක් බවට පත්ව ඇත. සියලූ ජාතීන් එක්ව එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ විසඳුම් ඉදිරිපත් කළ ද පරණ මර උගුලෙන් ගැලවීමට තරම් විඥානයක් අපගේ දේශපාලනඥයන්ට හා නිලධාරීන්ට නොමැත. ඒ නිසා පුළුල්  සබුද්ධික ජනතා ව්‍යාපාරයක් මගින් මෙම අර්බුදයට විසඳුම් සෙවීමට බලපෑම් කළ යුතුව ඇත. ගාලුමුවදොර ජනතා ව්‍යාපාරය මගින් මෙම යෝජනාවලිය සමාජය හමුවේ තබනු ලබන්නේ ඒ වෙනුවෙනි.

තිරසර සංවර්ධන උපාය උපායමාර්ග අප තෝරාගත යුත්තේ දැන් උද්ගතව ඇති අර්බුදය ජය ගැනීමට ඇති වඩාත්ම හිතකර හා වාසි සහගත උපාය මාර්ගය වන හෙයිනි. මහාපරිමාණ ආයෝජන මත පදනම් නොවේ. විදේශීය ණය හා ප්‍රාග්ධනය මත පදනම් විය යුතු නොවේ. දේශීය අමුද්‍රව්‍ය හා මහජන ශක්තිය මත පදනම් විය හැකි වේ. කිසිම විදේශීය රටකට ගැති විය නොවේ. මෙන්ම ලෝක මට්ටමින් සහයෝගය ලබාගත හැකිය. දැන් පවත්නා අර්බුදයට මහජනයා මත පදනම් වී අපේම ස්ව ශක්තිය මත නැගී සිටිය හැකි වනු ඇත. ඒ තුළින් තිරසර සංවර්ධනයේ ආදර්ශමත් රට ලෙස ලෝකයාගේ ගෞරවයට පාත්‍ර වෙමින් ලෝකයට ආදර්ශයක් සැපයීමට හැකි වනු ඇත. දැන් පවත්නා අර්බුදයට ඒකායන විසඳුම් මාර්ගය වන්නේ එයයි.

**කෙටි කාලීනව සාධනය කරගත යුතු ව්‍යවස්ථාමය හා පාලන තන්ත්‍රය සම්බන්ධ ඉලක්ක.**

දැන් පවත්නා දැවෙන ප්‍රශ්ණ වලට විසඳුම් ලෙස ගාලුපාරේ අරගලකරුවන් ලෙස විවිධ යෝජනා සමාජගත කර ඇත. එමෙන්ම නිතිඥ සංගමය හා වෙනත් සංවිධාන ද යෝජනා ඉදිරිපත් කර ඇත.

ඒ අතර ජනධිපති ගෝඨාභාය රාජපක්ෂ හැර පවුලේ අනිත් සියල්ලෝ තනතුරු වලින් ඉවත්වී නව අගමැතිවරයෙකු ලෙස අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පත්කර ඇත. එහෙත් ඊට දැන් මාසයක කාලයක් ගතවී ඇත. පවත්නා අර්බුදය තවත් බරපතල වී ඇත. ඒ අතර රටට හානිකරවූ තීන්දු ගන්නා බව පෙනෙන්නට තිබේ. දැවැන්ත සමාගම් වලට පුනර්ජනනීය විදුලි නිෂ්පාදනය සඳහා ටෙන්ඩර්පටිපාටියෙන් බැහැරව කැඳවීමට හැකිවන ලෙස පනත් සංශෝධනය කරගෙන ඇත. එමෙන්ම තෙල් පිළිබඳ සිල්ලර වෙළඳාමට අදාල කැබිනට් පත්‍රිකාවක් ද සම්මත කර ඇත. මෙම තීන්දු රටට අහිතකර වන අතර දැන් පවත්නා ගැටලුවට විසඳුමක් ද නොවේ.

දැන් පවත්නා අණ්ඩුවට සර්වපක්ෂික එකගතාවයෙන් තීන්දු ගන්නා ආණ්ඩුවක් නොවේ. එය මෙවැනි බරපතල අර්බුදයකදී මුළු රටම ආරාජිත තත්වයට පත්වීමකි.

එමෙන්ම ගාලු පාරේ අරගල කරුවන්ගේ ප්‍රධාන යෝජනා අතර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා ගෝඨාභය ඉල්ලා අස්වීම ද යෝජනා කර ඇත. එය පහසුවෙන් ක්‍රියාවට නැගිය හැකි සටන් පාඨයක් නොවේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම හා අහෝසි කරන්නේනම් නව ව්‍යාව ස්ථව තුළ අන්තර් ගත ජන්ද ක්‍රමය පළාත් සභා ක්‍රමය හා වෙස්මිනිස්ටර් ක්‍රමය යලි ස්ථාපිත කිරීම කෙසේ සිදු වන්නේද යන්න පිළිබඳ නිෂ්චිත හා නිවැරදි පිළිතුරක් නොමැත්තේනම් රට තවත් අනතුරකට හෙලිමක් බව අප ප්‍රකාශ කළ යුතුය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා 3 /2 පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන ජනමත විචාරණයකින් එය සම්මත කර ගත යුතුය. ජනමත විචාරණයකින් ලැබෙන පිළිතුර කෙසේද යන්න තීරණය වන්නේ අප ඉදිරිපත් කරන ව්ව්‍යවස්ථාවේ ස්භාවය අනුවය. එම ව්‍යවස්ථාව සියලුම පාර්ශවයන්ගේ අවම එකගතාවයකින් තොරව සම්මත කර ගත නොවේ.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුත්තේ අළුතින් පත් වන පාර්ලිමේන්තුවක් තුලයි. ඒ සඳහා මැතිවරණයක් පැවැත්වීය යුතුය. මේ සියලු යථාර්තයන් තේරුම් ගනිමින් අපගේ යෝජනාවලිය ඉදිරිපත් කෙරේ. ජන අරගලයේ ශක්තිය හා පාර්ලිමෙන්තුව තුල ප්‍රගතිශීලි පාර්ලිමෙන්තු නියෝජිතයන්ගේ ශක්තියද එකාබද්ධ කරගනිමින් පහත සඳහන් යෝජනා ක්‍රියාවට නැගිය යුතු වේ.

1. ජනාධිපතිවරයාගේ අත්තනෝමතික බලතල කප්පාදු කර පාර්ලිමේන්තුවට හා ස්වාධීන කොමිෂන් සභාවලට බලය ලබාදෙන 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කඩිනමින් පාර්ලිමේන්තුවේ සම්මත කළ යුතුය.

1.1 ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, විගණන කොමිෂන් සභාව, අධිකරණ කොමිෂන් සභාව, අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව, ඉඩම් කොමිෂන් සභාව ඇතුළු අදාල කොමිෂන් සභා කඩිනමින් ස්ථාපිත කළ යුතුය.

1.2 ආණ්ඩු වෙනස්වන විට වෙනස් නොවන ආකාරයෙන් රටේ සියළු ක්ෂේත්‍රවලට අදාලව දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා "ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක්" වහා ස්ථාපිත කළ යුතුය.

2. රටේ මේ වන විට උත්ගතවී ඇති අර්බුදකාරි හා අරාජික තත්වය පියමන් කිරීම සඳහා ජාතික මට්ටමේ පිලිගැනීමක් ඇති නායකයන්ගෙන්ද, වෘත්තිය ආයතන හා ජන අරගලයේ නියෝජිතයන්ගෙන්ද, සිවිල් සංවිධාන ක්‍රියාකාරිකයන්ගෙන්ද සැදුම්ලත් රාජ්‍ය උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කෙරේ. එම රාජ්‍ය උපදේශක මණ්ඩලය ජනාධිපතිතුමාට හා පාර්ලිමේනතුවට ඉහළින් සිටින උපදේශක මණ්ඩලයක් ලෙස අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතු වේ.

2.1 දැන් පවත්නා අත්‍යවශ්‍ය සේවා වන සෞඛ්‍ය සේවා හා වෙනත් සේවාවන්ගේ බිඳ වැටීම වැලැක්වීම සඳහාත් අත්‍යවශ්‍ය සේවාවන් සපුරා ගැනීමටත්, අසරණ භාවයට පත් ජනතාවට පිහිට වීමටත්, විදේශ රටවල වෙසෙන ශ්‍රී ලංකිකයන්ගෙන් හා වෙනත් ජාත්‍යන්තර ආයතන වලින් මුදල් ලබා ගැනීම සඳහා ජාතික පූනා්‍ය අරමුදලක් උපදේශක මණ්ඩලයේ අධික්ෂණය යටතේ ස්ථාපිත කළ යුතු අතර එහිදී රාජ්‍ය මට්ටමෙන් මහ බැංකු අධිපතිවරයාද අනුක්ත විය යුතු වේ.

3. කිසිදු ද්විත්ව පුරවැසියෙකුට පාර්ලිමේන්තුව නියෝජනය කිරීම, ජනාධිපතිධූරයට පත්වීම, රාජ්‍ය ආයතනවල ඉහළ තනතුරු දැරීම තහනම් කළ යුතුය.

4. නීතියේ සාධාරණත්වය තහවුරු කිරීම සඳහා නීතිපතිවරයාගේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් විනිවිදභාවයක් සහිතව වගවීම සහතික කරන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

5. විගණන කොමිෂන් සභාවේ සභාව බලාත්මක කිරීම හා අධිභාර පැනවීම සඳහා අවසානබලධාරියා ලෙස විගණකාධිපතිවරයා වෙත බලය ලබාදීම කළ යුතුය.

5.1 විගණන ක්‍රියාවලිය සෑම රාජ්‍ය ආයතනයක් හා නිළධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරයේ වැඩ පිළිවෙලක් දියත් කිරීම

6.මහ බැංකු අධිපති සහ මූල්‍ය මණ්ඩල සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් පත් කිරීම, අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීම, අග්‍රාමාත්‍යවරයාගේ එකගතාවයෙන් සිදු කිරීම.

7. තානාපති සබදතා ශක්තිමත් කිරීම හා සුදුසු තැනැත්තන් පමණක් තානාපතිවරුන් ලෙස පත් කිරීමට හැකිවන ක්‍රමවේදයක් සකස් කිරීම හා දැනට දේශපාලන පත්කිරීම් පදනම්ව ඇති තානාපතිවරුන් නැවත ගෙන්වීම හා නව සුදුසුකම් ලත් තානාපතිවරුන් පත්කිරීම.

8. වැටුප් වර්ධක ලබාදීමේ දී (රාජ්‍ය / පෞද්ගලික ) BMI දර්ශකය ද සලකා බැලීම.

9. අමාත්‍යවරුන් 20 දෙනෙකුගෙන් සමන්විත අන්තර්කාලීන සර්ව පාක්ෂික ආණ්ඩුවක් වහා පිහිටුවිය යුතුය.

10. සර්ව පක්ෂික ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා පාර්ලිමෙන්තුවේ බහුතර කැමැත්ත හා ජාතික උපදේශක මණ්ඩලයේ ද අදහස් විමසා පත් කළ යුතුය.

සියලුම අමාත්‍යංශයන්ට පාර්ලිමෙන්තු මන්ත්‍රිවරුන්ගෙන් හා ඒ ඒ අමාත්‍යංශ විෂය පතය පිළිවද අවබෝධයක් ඇති ප්‍රවීණයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කළ යුතුය. ඒ ඒ අමාත්‍යංශ ගත යුතු තීරණ සම්බන්ධයෙන් උපදේශක මණ්ඩලයේ එකගතාව මත සිදු කළ යුතු වේ.

11. සර්ව පක්ෂික ආණ්ඩුවේ ආයු කාලය මාස 18කට සීමාවේ.

12. මහා මැතිවරණය පැවැත්වීමෙන් අනතුරුව සමස්ථ පාර්ලිමෙන්තුවම ව්‍යවස්ථාමය මණ්ඩලයක් බවට පත් වෙමින් විධායක ජනාධිපතික්‍රමය අහෝසි කරන්නාවූ නව ව්‍යවස්ථාවක් අනුමැත ලකර ජනමත විචාරණයකට ඉදිරිපත් කළ යුතු වේ.

ලෝක මට්ටමින් ඉදිරියේදී බරපතළ ආහාර අර්බුදයක් ඇති වීමට නියමිතය. ශ්‍රී ලංකා වැනි රටකට එවැනි අර්බුදයක් ඇති නොවීමට පහසුවෙන් මග පාදා ගත හැකිය. එහෙත් ඒ පිළිබඳ කිසිම සැලැස්මක් රජයට නැත. ඉක්මනින්ම මෙම සැලැස්ම ජනගත කොට ඒ සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට බලපෑම් කළ යුතුව ඇත.

දැන් පවත්නා අර්බුදයට කෙටිකාලීන හා මැදි කාලීන විසඳුම් ඇතුලත් ජාතික ගොවි ප්‍රතිපත්තියක් සති දෙකක් තුළ ඉදිරිපත් කළ යුතුය.

වැඩපිළිවෙළ තුළ රජය අවශ්‍යයෙන්ම ගත යුතු ප්‍රතිපත්ති තීරණ මෙසේ වන්නේය.

- රජය ලබාදෙන පොහොර, පොහොර සහනාධාරය මුදල් ලෙස ජනතාවට ලබා දිය යුතුය.

- ඉදිරි වසර සඳහා වෙළඳපොල තුළ රසායනික පොහොර මිලදී ගැනීමේ පහසුකම් ඇති කළ යුතුය.
- ගොවිජන සේවා කාර්යාල මට්ටමින් හා ග්‍රාම සේවා සීමා මට්ටමින් පොහොර නිෂ්පාදන මධ්‍යස්ථාන ආරම්භ කළ යුතුය.
- ගෙවතු වගා සංග්‍රාමයක් ආරම්භ කළ යුතු අතර ඊට අදාළව අදාළව ඇති වඳුරු දඬුලේනුන් ආදී බාධක ඉවත් කිරීමට රජය කටයුතු කළ යුතුය.
- නැවත වගා කළ හැකි බීජ නිෂ්පාදන වේගවත් කළ යුතු නැවත වගා කළ හැකි බීජ ඉක්මනින් ආනයනය කළ යුතුය.
- වල් මර්දනය සඳහා අවශ්‍ය වන ට්‍රාන්ස්ප්ලාන්ටර් හා වීඩර් යන්ත්‍ර මෙරට නිෂ්පාදනය සඳහා සැලසුම් කළ යුතු අතර අවශ්‍ය වන එකී යන්ත්‍ර එතෙක් පිටරටින් ගෙන්වීමට කටයුතු කළ යුතු වේ.
- සෑම කුඹුරකට ම සෝලා යන්ත්‍ර සවි සවිකොට බැටරි මගින් විදුලිය ගබඩා කොට වතුර පොට්ස් ක්‍රියා කළ යුතු වේ.
- පාරම්පරික බීජ ප්‍රචලිත කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ප්‍රචලිත කළ යුතු වේ.
- මෑතකදී බඳවා ගනු ලැබූ සාමාන්‍ය පෙළ අසමත් ලක්ෂයක් තරුණයන් ඒ අතරින් සැලකිය යුතු පිරිසක් හා කෘෂිකර්ම ක්ෂේත්‍ර නිලධාරීන් වහාම පුහුණුවකට ලක්කොට ගොවි සේනාංකයක් ස්ථාපිත කළ යුතු වේ.
- ගොවි සමාගම් ඇති කිරීමට ධෛර්යය දිය යුතු ය.
- පුරන් කුඹුරු හා වගා නොකරන රජයේ හා පුද්ගලික ඉඩම් රජයට ගෙන ගොවි සමාගම් වලට පැවරිය යුතුවේ.
- පැල බද්ධකරණය ජීව පොහොර නිෂ්පාදනය බිම්මල් වගාව පසු අස්වනු තාක්ෂණයයි. සත්ව පාලනය වේගවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතු වේ.
- වගා සංග්‍රාමයක් උදෙසා ජනතාව පිබිදුවාලීමේ දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතු වේ.
- බීජ පර්යේෂණයන් සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ.
- ගොවි සමුපකාර සමිති ස්ථාපිත කොට තම නිෂ්පාදන සඳහා අගය කළ යුතු වේ. ඊට අදාලව සමුපකාර සමිති යටතේ වී මෝල් ඇති කිරීම, වී ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා විශේෂ ණය ක්‍රමයක් හඳුන්වා දිය යුතු වේ.

තෙල් සහ ගෑස් පෝලිම වලින් පෙන්නන්නෙ ලංකාවේ පවත්නා බල ශක්තිය අර්බුදයයි. අද ජනතාව පෙලෙන ප්‍රධාන දුක්ඛ සත්‍යය එයයි.මෙම අර්බුදය පවතින මේ මොහොතේත් පාලකයන් හා නිලධාරීන් මෙම අර්බුදය පසුගිය දස වසරක කාලය තුළ විකල්ප බලශක්තිය කරා පසුගිය වසර 150 ක කාලය තුළ මුළු මහත් ලෝකයේම ආධිපත්‍යය වූයේ ගල් අඟුරු හා පොසිල ඉන්ධන හා ස්වභාවික වායූන් ය. විශේෂයෙන්ම තෙල් සඳහා වූ අරගලය ලෝකයේ තෙල් බලය සඳහා ගෙවූ වන්දිය තුළ ලේ වලට වඩා තෙල් ඝන වූයේය. මහ පොළොව මත නිදන්ගත වූ මෙම පොසිල ඉන්ධන හා ගල් අඟුරු මතුපිටට ගෙන පුළුස්සා බල ශක්තියක් බවට පත් පත්කිරීම මහ සංවර්ධන ප්‍රාතිහාර්යකට මග පෑදුව ද එය දැන් මුළු මිහිතලයම බරපතළ පාරිසරික අනතුරකට හෙලා ඇත. ඒ නිසා විශේෂයම කාලගුණික විපර්යාස පිළිබඳ 2015 පැරීසියේ පැවති සමුළුවේ දී මුළු මහත් ලෝකයම 2015 වනවිට ක්‍රමානුකූලව විකල්ප බලශක්තිය කරා පරිවර්තනය විය යුතුමය. මිහිතලය මත ජීව පද්ධතියට පැවතිය හැක්කේ එසේ

වුවහොත් පමණි. ඒ නිසා ඒ පිළිබඳ එකඟතාවයකට පැමිණිය ද ලෝකයේ තෙල් හා ගල් අඟුරු ඒකාධිකාරයක් ඇති ප්‍රකෝටිපතියන් ඉක්මනින් මින් නිදහස් වීමට ඉඩ දෙන්නේ නැත. මෙන්න මේ වාසි සහගත තත්ත්වය අපි තේරුම් ගත යුතු ය. සිස්ටම් චේන්ජ් එක ආරම්භ වෙන්නේ මෙතැනින්. නමුත් ගාලු ගාලුපාරේ අරගල කරුවෝ හෝ ලංකාවේ දේශපාලනඥයෝ කිසිවෙක් මේ ගැන කතා කරන්නේ නැත. ලෝකයේ බොහෝ රටවල් අන්ත අරාජික තත්ත්වයට පත්වූයේ මෙම තෙල් සහ ගල් අඟුරු බල අරගලයේ කොටසක් ලෙසිනි. අපගේ රට තුළින් විදේශ රටවලට ඇදී යන ඩොලර් බිලියන 5 – 6 ත් අතර මුදලක් අපට නතර කරගැනීමේ වාතාවරණයක් පැදී තිබියදී අපේ රටේ නායකයෝ හා නිලධාරීන් හිතාමතාම මෙම වාසිසහගත තත්ත්වය නොසලකා හැරියේය.

අපි සදාකල් හිරු එළිය පතිත වන නිවර්තන කලාපීය රටකි. අපට හිරු එළියේ අඩුවක් නැත. එය අප වැනි නිවර්තන කලාපීය රටවලට ඇති වාසි සහගත තත්ත්වයකි. එමෙන්ම අප දූපතක් නිසා ඇති තරම් අපට සුළං බලය ඇත. මධ්‍ය කඳුකරයේ ඇති ජල විදුලි බලාගාර තුළිනුත් අපගේ විදුලි අවශ්‍යතාවය සපුරා ගත හැකි වනු ඇත. 2017 වන විට සූර්ය හා සුළං බලයෙන් විදුලිය මෙගවොට් 1000ක් නිපදවා ගත්තේ නම් අප හට මෙම තෙල් පෝලිම් ඇති වන්නේ නැත. ඊට අපට වැය වන්නේ ඩොලර් බිලියනයක් පමණ මුදලකි.

දැනට විදුලිය නිපදවීමේදී 65% ක් පමණ ගල් අඟුරු හා තෙල් යොදා ගැනේ. මේ වන විට එකී ගල් අගුරු අඟුරු බලාගාරයක් අකර්මණ්‍ය වී ඇත. ලෝකයේ මේ වන විට තෙල් ගල් අඟුරු හා ගෑස් යන තුනම ඉහළ යමින් පවතී. අප විදුලිය ලබාගැනීමට රාජ්‍ය මට්ටමේ තෙල් දහනය කොට ලබා ගන්නා බලාගාර මෙන්ම පෞද්ගලික බලාගාර ද පවතී. මෙහිදී මෙම අර්බුදය තේරුම් ගැනීම අද වෙන විට විදුලි බල මණ්ඩලය පෙට්‍රෝලියම් හා ආයතන කොතරම් බංකොලොත්දැයි කියතොත් ඩොලර් බිලියන 5ක පමණ ණයක් පවතී. අප විදුලි ඒකකයක් නිපදවීමට

රු.80/= ක් 90/= ක් අතර මුදලක් පර්නස් ඔයිල් මගින් විදුලිය නිපදවීමට යොදයි. ඊට අමතරව ඩීසල් මගින් විදුලිය නිපදවීම රු.110/= ක් හෝ ඊට ආසන්න මුදලක් වැය වේ. එහෙත් සූර්යාලෝකයෙන් හෝ සුළඟින් ගන්නා විදුලි ඒකකයට අප ගෙවන්නේ රු25/= ට අඩු මුදලකි. මෙහිදී මෙම අපරාධ හා වෙනස අප තේරුම් ගත යුතුය. විදුලිබල මණ්ඩලයේ ඉහළ නිලධාරීන් හා ඇමතිවරුන්ට විශාල වශයෙන් කොමිස් ගත හැක්කේ තෙල් හා ගල් අඟුරුවලින් විදුලිය නිපදවන නිසා ය. එනිසා මොවුන් මෙම විකල්ප බලශක්තිය කරා යොමු වීමට ඉඩ නොදෙයි.

පුනර්ජනනීය බල ශක්තිය පදනම් වන්නේ අපට ස්වභාවිකව ලැබෙන හිරු එළිය හා සුළඟ මගිනි. එහෙත් එම සුළඟ හා හිරු එළිය අප සමාගම් වලට විකුණුවහොත් අපගේ රටේ ඇති සම්පත්වලින් විදේශීය සමාගම් අධික ලාභයක් ලබා එම මුදල තම රටට ගෙන යනු ඇත. අන්තිමට අපේ සුළඟත් හිරු එළියත් අප විකුණා දමා බලශක්ති ස්වෛරීත්වය පිටරටකට පවරා දෙනු ඇත.

මේ වන විට ගෞතම් අදානි සමග ගිවිසුමක් අත්සන් කොට ඇති අතර එම ගිවිසුමට අනුව සූර්ය බලයෙන් උතුරු පළාතේ මෙගාවොට් 500ක් නිපදවීම සඳහා අක්කර 1000ක් ලබාදී ඇත. ඔහුට අප මුදල් ගෙවිය යුත්තේ ඩොලර්වලිනි. අපේම රටේ සම්පත්මත අප ඩොලර්වලින් මුදල් ගෙවන තැනකට අත්සන් තබා ඇත. කිසිදු අරගල කරුවෙක් මේ ගැන කතා කරන්නේ නැත. ගෝඨා - රනිල් ආණ්ඩුව විදුලි පණත වෙනස් කළේ මෙම අභිප්‍රායෙනි. අරගලකරුවෙක් මේ ගැන ජනමතයක් ගොඩනැගුවේ නැත.

ඒ අතර පෙට්‍රෝලියම් සමාගමේ බලයද දැනට කඩා වැටී ඇති අතර ජනතාව අන්ත අසරණ තත්වයකට පත්ව ඇත. මේ අවස්ථාව පරිහරණය කරමින් මේ වන විට I.O.C ඇතුළු තවත් සමාගම් ගණනාවකට තෙල් වෙළදාමේ ඒකාධිකාරය ලබා දීමට දැනටමත් මෙම රජය අනුමත කරගෙන ඇත. මෙම තත්වයන් වහා වෙනස් කොට දැන් පවත්නා බලශක්තිය තුළින් අප රට පරාධීනත්වයට පත්වීම වැලක්වීම උදෙසාත් මෙම ලේඛනය ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වයට හානි නොවන ලෙස පුනර්ජනනීය බලශක්තිය මත පදනම් වී බලශක්ති අර්බුදය ජයගන්නාවූ ජාතික ප්‍රතිපත්තියක් වහාම එළි දැක්විය යුතුවේ.

විදුලි අර්බුදය ජය ගැනීමට ගත යුතු පියවර

- දස ලක්ෂයක් වහල මත සෝලා පැනල් ඉදි කිරීම සඳහා සියලු බදු ඉවත් කොට ඒ සඳහා වහාම ඉඩ ලබා දිය යුතුය. මේ තුළින් මෙගා වෝට් දහසක් ලබා ගත හැකි වනු ඇත.
- බැටරි ගෙන ඒම සඳහා සියලු බදු ඉවත් කළ යුතුවේ. මේ තුළින් කොළඹ නගරයේ ගෙවල් 25000ක් මීට එකතුවුවහොත් එය විශාල වශයෙන් ඉන්ධන ඉතුරුවක් සිදු කළ හැකි වනු ඇත.
- මහා පරිමාණ විදේශිය සමාගම් වලට පුනර්ජනනීය විදුලි සඳහා අයෝජන කැදවීම් නතර කළ යුතුවේ. එසේ වන්නේනම් 51 % ක කොටස් ශ්‍රී ලංකාව සතු විය යුතුය.
- පුනර්ජනනීය විදුලිය සඳහා මිළදී ගැනීමේ මිල අවම වශයෙන් ඒකකයට රු. 30 ක් විය යුතුවේ.
- තෙල් පිරිපහදුවෙන් ලබා ගන්නා Furnace oil හැර පිටරටින් Furnace oil ගෙන්වීම නතර කළ යුතුවේ.
- තෙල් පිරිපහදුව අඛණ්ඩව ක්‍රියාක්මක කළ යුතුවේ.
- ශ්‍රී ලංකාව තෙල් ආනයනයේදී ඩීසල් හා භූමිතෙල් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුවේ.
- ත්‍රිවිල් හා කෘෂි කාර්මික යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ පැට්‍රල් සහනයක් ලබා දිය යුතුවේ.
- ඩීසල් ගෙන්වා විදුලිය නිපදවීම වහාම නතර කළ යුතුවේ.
- පැට්‍රල් මිල වැඩි කොට ඩීසල් මිළ මට්ටමක තබා ගත යුතුවේ.
- 2023 අගොස්තු වන විට වාහන වලින් 25 %ක් ඉලෙක්ට්‍රික් කිරීමට 2019 දී එකගවූවත් එය සිදු නොමැති බැවින් වහාම එම පියවර කඩිනමින් කළ යුතුවේ.
- මින් ඉදිරියට සියලු වාහන ආනයනයේ දී ඉලෙක්ට්‍රික් වාහන පමණක් ආනයනය කළ යුතු අතර පවත්නා අර්බුද තත්වය තුළ ඉලෙක්ට්‍රික් වාහන ගෙන්වන පුද්ගලික හා ව්‍යාපාරික මට්ටමේ අය හට සියලු බදු ඉවත්කළ යුතුවේ.
- සහනදායි මිළකට පාපැදි හා ඉලෙක්ට්‍රික් පා පැදි ආනයනයට ඉඩ ලබා දිය යුතුවේ.
- සෙනසුරාදා හා ඉරිදා දිනවල පාපැදි පරිහරණයදිරිමත් කළ යුතුවේ.
- වර්ෂයකට විදේශ රට පවලින් ගෑස් ගෙන්වීම සඳහා ඩොලර් මිලියන 35 පමන වැය වේ. අද ගෑස් පොලින් ලංකාවේ ඇති විශාලම අර්බුදයයි. ඊට විසඳුමක් ලෙස අගුරු ලිප්, ජීව වායු ඒකක නර්ඩ් ආයතන මගින් හා නව නිපයුම් කරුවන් විසින් වැඩි දියුණු කර ඉදිරිපත් කර ඇත. වහාම මෙම නිෂ්පාදන කරුවන්ට අත්‍යාවශ්‍ය ණිය පහසුකම් ලබා දී ගෑස් පොලිම් නැති කොට දේශිය විසඳුමක් ලබා දිය හැකිය.

**සමූපකාර ක්‍රමය**

දැනට රටේ පවත්නා ආර්ථික අර්බුදයේදී පාඩු ලබන බොහෝ රාජ්‍ය ආයතන පෞද්ගලිකරණයට මේ අධම පාලකයින් පෙළඹිය හැකිය. ලෝකයේ බොහෝ රටවල අසාර්ථක රාජ්‍ය ආයතන යලි ලාභ ලබන ආයතන බවට පත් කර ගත් ක්‍රමවේදය වූයේ එම රාජ්‍ය ආයතනයන්හි බලය රාජ්‍ය නිලධාරින් ඇතුළු සේවකයන්ට ලබා දීමෙනි. ඒ අනුව දුම්රිය, ගුවන් සේවය, ලංගම වැනි ආයතන සමුපකාර ක්‍රමය යටතේ ජනතාවට ලබා දිය යුතුය.

■ **කර්මාන්ත**

අප රටේ පවතින ඉල්මනයිට්, මිනිරන්, පොස්පේට්, වැනි අමුද්‍රව්‍ය ඇතුළු ස්වාභාවික සම්පත් අමුද්‍රව්‍ය වශයෙන් අපනයනය කිරීම වෙනුවට අගය එකතු කළ නිමි භාණ්ඩ වශයෙන් අපනයනය කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම රටේ පවතින සම්පත් අනුව කුඩා පරිමාණ ව්‍යාපෘති 2000 ක් හදුනාගෙන ඒවා සඳහා විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයින්ට ආයෝජනය කිරීමට ආරාධනා කළ යුතුය.

පවතින ආහාර තෙල් ඉන්ධන ගෑස් ආදී ජනතා ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලෙස නිර්පාක්ෂික ජන අරගලකරුවන් විසින් ප්‍රයෝගිකව ක්‍රියාවට නංවන ව්‍යාපෘති මාලාව.